*සැ. යු.* - 2022.06.03 වැනි දින පළ වූ 2283 දරන *ගැසට් පත්‍රයේ* I: II (අ) සහ IV (අ) කොටස් පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,284 - 2022 ජුනි මස 10 වැනි සිකුරාදා - 2022.06.10**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | 160 |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |

| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරි විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 159 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | 159 |

*සැ. යු.* - (i) පළාත් පාලන ආයතන මැතිවරණ (සංශෝධන) පනත් කෙටුම්පත 2022 මැයි මස 27 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී.

(ii) අන්තරායකර සත්ත්ව (සංශෝධන) පනත් කෙටුම්පත 2022 මැයි මස 27 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2022 ජූලි මස 01 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 ජුනි මස 17 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

165 - B 82353 - 353 (2022/06)
E -1

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

උතුරු මැද පළාත් සභාවේ, හිඟුරක්ගොඩ, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් රාජපක්ෂ මොහොට්ටිගේ දෝන ප්‍රියදරශනී පුෂ්ප කුමාරි වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 2016 වර්ෂයේ ජනවාරි මස 26 වැනි දින ප්‍රදානය කර ඇති අංක පො/ප්‍ර/947 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන දරනියගලගේ ඇලිස් නෝනා වෙත ප්‍රදානය කොට පොළොන්නරුව දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 02/947 යටතේ 1982.02.19 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද, ඔහු/ ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇත. එබැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2022 ජූලි මස 08 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

පෙළොන්නරුව පරිපාලන දිස්ත්‍රික්කයේ, හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සිංහල පත්තුවේ/කෝරළේ අංක 70 ගිරිතලේ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ජයන්ති කොළණිය නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක අ. ජ. පි. පො. 42 දරන පිඹුරෙහි අංක 344 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් අක්. 01, පර්. 08ක් විශාලත්වය ඇත්තාවූ ද දැක්වෙන පරිදි මායිම් වූ ද, රජයේ ඉඩම : අග්බෝවත්ත යනුවෙන් හඳුන්වන ඉඩම.

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 345, |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 363, |
| *දකුණට* | : | කැබලි අංක 361, |
| *බස්නාහිරට* | : | කැබලි අංක 361. |

එච්. එස්. කේ. ජේ. බණ්ඩාර,
ප්‍රාදේශීය ලේකම්, *(වැ. බ.)*
හිඟුරක්ගොඩ.

2022 පෙබරවාරි මස 22 වැනි දින.

06-115

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

දකුණු පළාත් සභාවේ මාතර දිස්ත්‍රික්කයේ, දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ඩී. පී. ලියන පටබැඳි වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1983.06.21 වැනි දින ප්‍රදානය කර ඇති අංක මාතර/ප්‍ර/6085 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන උඩ අපරැක්ක පදිංචි ලොකුපට්ටියගේ ඩේවිඩ් වෙත ප්‍රදනය කොට මාතර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක LDO 1001යටතේ 1985.11.15 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද, ඔහු/ ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තික භාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2022.07.22 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

දකුණු පළාතේ, මාතර පරිපාලන දිසත්‍රික්කයේ, දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වැල්ලබඩ පත්තුව බටහිර ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාසයේ වැල්ලබඩ පත්තුවේ උඩ අපරැක්ක ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නමැති උඩ අපරැක්ක ගමේ පිහිටා ඇති සර්වේ ජනරාල්වරයා විසින් සාදනු ලැබ, ඔහු භාරයේ ඇති අංක පී. පී. 1084 දරන පිඹුරෙහි අංක 38 දරන බිම් කැබැල්ල වශයෙන් නිරූපනය කර ඇති ප්‍රමාණයෙන් රූඩ් 03, පර්. 34ක් ඇතැයි ගණන් බලා තිබෙන කැකුණගහහේන යනුවෙන් හඳුන්වනු ලබන පහත සඳහන් පරිදි මායිම් වූ රජයේ ඉඩම් කට්ටිය.

| | | |
|---|---|---|
| *උතුරට* | : | මු. පි. මාර. 1084 හි 35, 22 කැබලි, |
| *නැගෙනහිරට* | : | මු. පි. මාර. 1084 හි 22 කැබැල්ල, |
| *දකුණට* | : | මු. පි. මාර. 1084 හි 42, 41 කැබලි, |
| *බස්නාහිරට* | : | මු. පි. මාර. 1084 හි 40, 39 කැබලි. |

ඩී. පී. ලියන පටබැඳි,
ප්‍රාදේශීය ලේකම්,
නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්
(අන්තර් පළාත්),
දෙවිනුවර.

2022 මාර්තු මස 04 වැනි දින.

06-200/1

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය**

දකුණු පළාත් සභාවේ මාතර දිස්ත්‍රික්කයේ, කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) වර්ණකුලසූරිය පටබැඳිගේ ශානිකා ඉරෝෂනී පෙරේරා වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1995.11.29 වැනි දින ප්‍රදානය කර ඇති අංක මාර/6/ප්‍ර/23320 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු මොරවක පදිංචි සමරසිංහ පතිරණගේ ආරියදාස වෙත ප්‍රදානය කොට කොටපොල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 597 යටතේ 1997.03.05 වැනි දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද, ඔහු/ ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2022.07.22 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

උපලේඛනය

මාතර පරිපාලන දිස්ත්‍රික්කයේ, කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මොරවක පත්තුවේ/කෝරළේ මොරවක ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ මොරවක නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, සර්වේ ජනරාල්වරයා භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක - දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි/සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක අ. ග. පි. 4 x 40 දරන කට්ටි කැඩීමේ පිඹුරේ/සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක - දරන රේඛා සටහනේ අංක - දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් අක්. 01ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දක්වෙන පරිදි මායිම් වූ ද, රජයේ ඉඩම : බොගටුගහහේන.

| | | |
|---|---|---|
| *උතුරට* | : | ආර්. ජේ. බේබිනෝනාගේ ඉඩම, |
| *නැගෙනහිරට* | : | පාර රක්ෂිතය, |
| *දකුණට* | : | පාර රක්ෂිතය, |
| *බස්නාහිරට* | : | එම්. එල්. ජයතිලකගේ ඉඩම. |

ඩබ්. පී. ශානිකා අයි. පෙරේරා,
ප්‍රාදේශීය ලේකම්,
කොටපොල.

2022 මාර්තු මස 10 වැනි දින.

06-200/2

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය**

දකුණු පළාත් සභාවේ, මාතර දිස්ත්‍රික්කයේ, කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් වර්ණකුලසූරිය පටබැඳිගේ ශානිකා ඉරෝෂනි පෙරේරා වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1983.04.27 වැනි දින ප්‍රදානය කර ඇති අංක මාතර/ප්‍ර6322 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු හොරගල පදිංචි ගමාච්චිගේ නොන්තොහාමි වෙත ප්‍රදානය කොට කොටපොල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 892 යටතේ 1985.11.04 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද, ඔහු/ ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2022.07.22 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

උපලේඛනය

මාතර පරිපාලන දිස්ත්‍රික්කයේ කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මොරවක් පත්තුවේ/කෝරළේ වරල්ල (දූනට හොරගල බටහිර) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ හොරගල නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, සර්වේ ජනරාල්වරයා භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 16 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 16 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි/සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක අ. ග.පි. 16 දරන කට්ටි කැඩීමේ පිඹුරේ/ සර්වේ ජනරාල් වරයා විසින් සම්පාදිත අංක - දරන රේඛා සටහනේ අංක 461 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් රූඩ් 01, පර්. 14ක් විශාලත්වයෙන් ඇත්තාවූ ද, පහත දක්වෙන පරිදි මායිම්වූ ද, රජයේ ඉඩම ඇල්ලෙගාවහේන.

| | | |
|---|---|---|
| *උතුරට* | : | අ. ග. පි. 16 හි 464 කැබැල්ල, |
| *නැගෙනහිරට* | : | අ. ග. පි. 16 හි 462 කැබැල්ල, |
| *දකුණට* | : | අ. ග. පි. 16 හි 464 කැබැල්ල, |
| *බස්නාහිරට* | : | අ. ග. පි. 16 හි 464 කැබැල්ල, |

ඩබ්. පී. ශානිකා අයි. පෙරේරා,
ප්‍රාදේශීය ලේකම්,
කොටපොල.

2022 අප්‍රේල් මස 07 වැනි දින.

06-200/3

## ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

දකුණු පළාත් සභාවේ, මාතර දිස්ත්‍රික්කයේ, දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් සුසන්ත අත්තනායක වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1983.04.25 වැනි දින ප්‍රදානය කර ඇති අංක මාතර/ප්‍ර/2286 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන දික්වැල්ල උතුර පදිංචි තල්පාවිල විදාන කංකානම්ගේ පීටර් යන අය වෙත ප්‍රදානය කොට මාතර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක LDO 342 යටතේ 1996.02.07 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2022.07.22 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

### උපලේඛනය

දකුණු පළාතේ, මාතර පරිපාලන දිස්ත්‍රික්කයේ, දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වැල්ලබඩ පත්තුවේ දික්වැල්ල උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දික්වැල්ල උතුර නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, සර්වේ ජනරාල් භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 0 25/32 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක මු. පි. මාර 87 දරන පිඹුරේ අංක 24 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් පර්. 20.5 ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද, රජයේ ඉඩම කෝන්ගහහේන.

| | | |
|---|---|---|
| *උතුරට* | : | මු. පි. මාර. 87 හි, 23 කැබැල්ල, |
| *නැගෙනහිරට* | : | මු. පි. මාර. 87 හි 22 කැබැල්ල, |
| *දකුණට* | : | මු. පි. මාර. 87 හි 25 කැබැල්ල, |
| *බස්නාහිරට* | : | මු. පි. මාර. 87 හි 14 කැබැල්ල. |

සුසන්ත අත්තනායක,
ප්‍රාදේශීය ලේකම්,
දික්වැල්ල.

2021 නොවැම්බර් මස 11 වැනි දින.

06-200/4

## ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

දකුණු පළාත් සභාවේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) ඉසංක ලක්මාල් වික්‍රමනායක වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1997 පෙබරවාරි මස 12 වැනි දින ප්‍රදානය කර ඇති අංක හම්/11/ප්‍ර 39317 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන අංක 566, සාලියපුර තිස්සමහාරාමය පදිංචි ගලප්පත්ති බෙරෙඤ්ඤෙලාගේ විල්බට් පෙරේරා වෙත ප්‍රදානය කොට හම්බන්තොට දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක හම්/234/192/98 යටතේ 1998.02.17 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයකු සිටිය ද, ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2022.07.08 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

### උපලේඛනය

හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ, ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාගම් පත්තුවේ/කෝරලේ සාලියපුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කුඩා ගම් 06 නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, සර්වේ ජනරාල් භාරයේ ඇති සහ සර්වේයර් ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 47 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි - විසින් සම්පාදිත අංක 57 දරන කට්ටි කැඩීමේ පිඹුරේ - විසින් සම්පාදිත අංක - දරන රේඛා සටහනේ අංක 2142 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.211 ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම.

| | | |
|---|---|---|
| *උතුරට* | : | ඉඩම් අංක 2139, |
| *නැගෙනහිරට* | : | ඉඩම් අංක 2138 හා 2143, |
| *දකුණට* | : | ඉඩම් අංක 2146 හා 2147, |
| *බස්නාහිරට* | : | ඉඩම් අංක 2098. |

අයි. එල්. වික්‍රමනායක,
ප්‍රාදේශීය ලේකම්,
ලුණුගම්වෙහෙර.

2021 පෙබරවාරි මස 24 වැනි දින.

06-198

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය**

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් බෝගහපිටියේ සේරසිංහ ගමගේ රුවන්සිරි වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1988 මැයි 17 වැනි දින ප්‍රදානය කර ඇති අංක රත්/ප්‍ර/7264 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන දෙමනගම්මන පදිංචි කිරිබත්ගලගේ මාටින් වෙත ප්‍රදනය කොට රත්නපුර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 873 යටතේ 1988 අගෝස්තු මස 31 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2022.07.22 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

උපලේඛනය

රත්නපුර පරිපාලන දිස්ත්‍රික්කයේ,පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මැද පත්තුවේ, නවදුන් කොරළේ වැලිමළුව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, දෙමනගම්මන නැමති ගමේ පිහිටා ඇත්තාවූ ද, රත්නපුර මිනින්දෝරු අධිකාරි භාරයේ ඇති සහ සර්වේ ජෙනරාල් වරයා විසින් සම්පාදිත ක්ෂේත්‍ර පත්‍ර අංක 17 අවසාන ගම් සිතියම් අංක 16 හි කැබලි අංක 477 දරන හෙක්ටයාර් 0.098 විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම දෙකන්ද මූකලාන *හෙවත්* අමුකොළ මූකලාන.

*උතුරට* : කැබලි අංක 475,
*නැගෙනහිරට* : කැබලි අංක 476,
*දකුණට* : කැබලි අංක 476,
*බස්නාහිරට* : කැබලි අංක 463.

බී. එස්. ජී. රුවන්සිරි,
ප්‍රාදේශීය ලේකම්,
පැල්මඩුල්ල.

2022 මාර්තු මස 18 වැනි දින.

06-199

---

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/69575.
ප්‍රාදේශීය ලේකම් (පානම්පත්තුව) ලාහුගල ගේ අංකය : LND/ Land/LOTLI/02/03.

**21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය**

අම්පාර දිස්ත්‍රික්කයේ, ලාහුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පා. ප. 2 - පානම දකුණ ග්‍රාම නිලධාරි වසමේ පානකල ගමේ ජනපද නිලධාරි විසින් අඳින ලද දළ අනුරේඛනයේ දැක්වෙන ප්‍රමාණයෙන් අක්කර 03ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ල වාණිජ පදනමින් රෙංගසාමී ක්‍රිෂ්ණවේනි මිය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

01. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත දැක්වේ :

*උතුරට* : ජයන්තිමාලාගේ ඉඩම,
*නැගෙනහිරට* : මුහුදු වෙරළ රක්ෂිතය,
*දකුණට* : ඒ. එල්. ඒ. එච්. ප්‍රියන්ත ලියනගේ හට යෝජිත ඉඩම,
*බටහිරට* : කලපු ඇල රක්ෂිතය.

02. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට සහ පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

(අ) *බදු කාලය*.- අවුරුදු තිහයි (30) (ගරු ඇමතිතුමා අනුමත කළ 2022.03.29 දින සිට ඉදිරියට).

*වාර්ෂික බදු මුදල*.- 2022 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 2%කි. 2022 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) ට වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොල වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20%ක් එකතු විය යුතු ය.

*වාර මුදල.* - වාර මුදලක් අය නොකෙරේ.

*(ඈ)* මෙම ඉඩම වාණිජ කටයුතු සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

*(ඈ)* මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළත දී පළාත් ඉඩම් කොමසාරිස්/ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි සංවර්ධනය කළ යුතු ය.

*(ඉ)* පළාත් ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය.

*(ඊ)* සාදා ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය.

*(උ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක, බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(ඌ)* බද්ද ක්‍රියාත්මක වන දින සිට වසර 05ක් ගත වනතුරු අතුරු බදුදීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(ඍ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේට ම අහෝසි වනු ඇත.

මෙම නිවේදනය පළ වූ දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

එස්. වී. ඒ. ඩී. ඉෂාරා එම්. සමරතුංග,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2022 මැයි මස 09 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල හි පිහිටි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

06-157

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/69576.
ප්‍රාදේශීය ලේකම් (පානම්පත්තුව) ලාහුගල ගේ අංකය : LND/Land/LOTLI/02/03.

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය

අම්පාර දිස්ත්‍රික්කයේ, ලාහුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පා. ප. 2 - පානම දකුණ ග්‍රාම නිලධාරි වසමේ පානකල ගමේ ජනපද නිලධාරි විසින් අඳින ලද දළ අනුරේඛනයේ දැක්වෙන ප්‍රමාණයෙන් අක්කර 05ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ල වාණිජ පදනමින් අඹේගොඩ ලියන ආරච්චිගේ හර්බට් ප්‍රියන්ත ලියනගේ මයා විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

01. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත දැක්වේ :

*උතුරට* : ආර්. ක්‍රිෂ්ණවේනි යන අයට යෝජිත ඉඩම,
*නැගෙනහිරට* : මුහුදු වෙරළ රක්ෂිතය,
*දකුණට* : කලපු ඇල හා මෝය රක්ෂිතය,
*බටහිරට* : කලපු ඇල රක්ෂිතය.

02. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට සහ පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

*(අ)* *බදු කාලය .-* අවුරුදු තිහයි (30) (ගරු ඇමතිතුමා අනුමත කළ 2022.03.29 දින සිට ඉදිරියට).

*වාර්ෂික බදු මුදල.-* 2022 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 2%කි. 2022 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) ට වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොල වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20%ක් එකතු විය යුතු ය.

*වාර මුදල.* - වාර මුදලක් අය නොකෙරේ.

*(ඈ)* මෙම ඉඩම වාණිජ කටයුතු සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

*(ඈ)* මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළත දී පළාත් ඉඩම් කොමසාරිස්/ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි සංවර්ධනය කළ යුතු ය.

*(ඉ)* පළාත් ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය.

*(ඊ)* සාදා ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය.

*(උ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක, බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(ඌ)* බද්ද ක්‍රියාත්මක වන දින සිට වසර 05ක් ගත වනතුරු අතුරු බදුදීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(එ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේට ම අහෝසි වනු ඇත.

මෙම නිවේදනය පළ වූ දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

එස්. වී. ඒ. ඩී. ඉෂාරා එම්. සමරතුංග,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2022 මැයි මස 09 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල හි පිහිටි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

06-158

---

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/32821.
සහකාර ඉඩම් කොමසාරිස්ගේ අංකය : KN/ALC/M2/LTL/593 II.

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, කන්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් හාතියගම ග්‍රාම නිලධාරි වසමේ කන්තලෙ, හාතියගම, ජයන්ත මාවත ගමේ අංක Tri/KNT/2010/022 දරන දළ අනුරේඛනයේ හි කැබලි අංක බී හා ඩී දරන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.1395 ක් වූ රජයේ ඉඩම් කොටස කෘෂිකාර්මික කටයුතු සඳහා ලෙව්දෙනියේ ගෙදර සොපියා මිය නමින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

01. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ :

කැබලි අංක බී හි මායිම් -

*උතුරට* : කුඹුරු ඇල,
*නැගෙනහිරට* : කුඹුරු ඇල,
*දකුණට* : කැබලි අංක සී සහ කැබලි අංක ඒ,
*බටහිරට* : කැබලි අංක 9165.

කැබලි අංක ඩී හි මායිම් -

*උතුරට* : කැබලි අංක සී සහ කැබලි අංක ඒ,
*නැගෙනහිරට* : කුඹුරු ඇල,
*දකුණට* : කැබලි අංක 9165,
*බටහිරට* : කැබලි අංක 9165.

02. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

*(අ)* *බදු කාලය.-* අවුරුදු තිහයි (30) (1995.06.15 දින සිට ඉදිරියට),

*වාර්ෂික බදු මුදල.-*ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 1995 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05කට වරක් ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ බදු මුදලින් 50%කට නොඅඩු විය යුතු ය.

*දඩ මුදල.* - ඉඩමේ දියුණු වටිනාකමින් 4% බැගින් වූ මුදල මෙන් තුන් ගුණයකි.

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුණ දින සිට අවුරුදු 01ක් ඇතුළත දී පළාත් ඉඩම් කොමසාරිස්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය.

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම කෘෂි කාර්මික කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

*(ඈ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය.

*(ඉ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක, බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(ඊ)* 1995.06.15 දින සිට වසර 05 ක කාලයක් ඉක්මවීමට කලින් අතුරු බදු දීම හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(උ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේට ම අහෝසි වනු ඇත.

*ගැසට් පත්‍රයේ* පළ කළ දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

කේ. එල්. පී. සුභාෂිණි,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2022 මැයි මස 19 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලයේ,
''මිහිකත මැදුර'', රජමල්වත්ත පාර,
බත්තරමුල්ලෙහි පිහිටි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

06-116

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.